Department of Education, Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

**විෂය - චිත්‍ර කලාව**

**සතිය- 01**

**ශ්‍රේණිය - 09**

**සැකසුම - එල්.මහේෂ් විජේවර්ධන**

**නිපුණතාවය** - ආගමික හා සංස්කෘතික අංග, දෙස් විදෙස් තෝරාගත් ශිල්පීන්ගේ කලා නිර්මාණ, අද්‍යතන දෘෂ්‍ය කලාකෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලීව රසාස්වාදයට ලක්කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.

**නිපුණතා මට්ටම** - තෝරාගත් ශිල්පීන්ගේ කලා කෘති රසාස්වාදය කරයි.

**ක්‍රියාකාරකම** - එස්.පී. චාර්ල්ස් ශිල්පියාගේ නිර්මාණ අගයමු

**පැවරුම** - පහත සඳහන් කියවීම් පත්‍රිකාව කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

<u>**කියවීම් පත්‍රිකාව**</u>

<u>**එස්. පී. චාර්ල්ස්**</u>

- 1916 මාතර වැලිගම උපත ලත් එස්. පී. චාර්ල්ස් කොක්මාදුවේ නානායක්කාර ශිල්පියා යටතේ මූලික ව චිත්‍ර කලාව ප්‍රගුණ කර ඇත.
- පාරම්පරික බෞද්ධ සිතුවම් පිටපත් කිරීම හා එහි උන්නතිය වෙනුවෙන් විශාල මෙහෙවරක් කළ ශිල්පියෙකි.
- එස්. පී. චාර්ල්ස් 1944 දී කොළඹ කාර්මික විදුහලේ චිත්‍ර අංශයේ ජේ.ඩී.ඒ. පෙරේරා යටතේ අධ්‍යාපනය ලැබුවෙකි.
- ශ්‍රී ලංකා රජයේ ජාතික කොඩිය හා පාර්ලිමේන්තුවේ සංකේතය වන සෙංකෝලය යන නිර්මාණ සඳහා ඔහුගෙන් ලද දායකත්වය ඉතා විශිෂ්ඨ වේ.

<u>**ජාතික කොඩිය**</u>



- වර්තමාන ජාතික කොඩිය වශයෙන් භාවිත කරන තිරු සහිත කොඩිය 1949 නිර්මාණය කරන ලද්දකි.
- ශ්‍රී ලංකාවේ අනන්‍යතාවය හා අභිමානය පිළිබිඹු කරන ලෙස ජාතික සංකේත භාවිත කරමින් කරන ලද නිර්මාණයකි.
- ජාතික කොඩියේ වර්ණ හා සංකේත මගින් පිළිබිඹු කරන අර්ථ නිරූපණය
    - කඩුව අතින් ගත් සිංහයා - තේජස හා උත්තරීතරභාවය
    - අසිපත - පරමාධිපත්‍යය
    - බෝකොළ සතර - සතර බ්‍රහ්ම විහරණ (මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා)
    - රඹපාට තිරුව - ද්‍රවිඩ ජනතාව
    - කොළපාට තිරුව - මුස්ලිම් ජනතාව
    - තද රතුපාට පසුබිම - සිංහල ජනතාව

1. එස්.පී. චාර්ල්ස් ශිල්පියා ගැන කෙටි හැඳින්වීමක් කරන්න
2. ජාතික කොඩිය මගින් පිළිබිඹු කරන්නේ කුමක්ද
3. ජාතික කොඩියේ රූපසටහනක් ඇඳ අදාළ පරිදි වර්ණ කරන්න
4. ජාතික කොඩියේ එක් එක් කොටසින් ප්‍රකාශ වන අර්ථය නම් කරන්න